# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TIP/SS/01/03/02
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.06. 01

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 01/2016 (II)**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත

**සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

2017 මැයි මස 02 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයට අනුව රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නිරත වන ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ පරිපාලන, කළමනාකරණ සහ වෘත්තීමය තනතුරුවල නිරත වන නිලධාරීන් සඳහා සහනදායී පදනමින් මෝටර් රථ ආනයනය කිරීම සඳහා සහ දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිලදී ගැනීමට අදාලව 2016.07.14 දින නිකුත් කරන ලද වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි 3.10. iii, සහ 3.10. v යන ඡේදයන් ඉවත් කර පහත ඡේදයන් ඇතුලත් කරනු ලබන අතර එම චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සියලු කරුණු එලෙසම නොවෙනස්ව පවතී.

මෙම චක්‍රලේඛ විධිවිධානයන් 2017.06.10 දින සිට බලාත්මක වේ. ඒ අනුව එදින හෝ එදිනෙන් පසුව රේගුවෙන් නිදහස් කරනු ලබන වාහන සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ විධිවිධානයන් අදාල කරගත යුතුය.

**3.10.iii** සහනදායී මෝටර් රථ බලපත්‍රය උපයෝගී කර ගෙන මෝටර් රථ ආනයනය කිරීමේදී සහ දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිලදී ගැනීමේදී බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු සමස්ත නිෂ්පාදන බද්ද සහ ලැබෙන බදු සහනයන් පහත පරිදි වේ.

| වාහන කාණ්ඩය | මි.ර.ගැ. වටිනාකම (ඇ.එ.ජ.ඩොලර්) | ගෙවිය යුතු සමස්ත නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දෙන් | |
|---|---|---|---|
| | | ගෙවිය යුතු බද්ද | බදු සහනය |
| 1 වන වාහන කාණ්ඩය | 25,000 හෝ ඊට අඩු | 35% | 65% |
| 2 වන වාහන කාණ්ඩය | 25,000 ට වැඩි එහෙත් 30,000 ට නොවැඩි | 40% | 60% |

අදාල රේගු සටහන්කරය (CUS DEC) ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ පවත්නා බදු අනුපාතයන් සහ වාහනයේ වටිනාකම අනුව ඉහත පරිදි ගෙවිය යුතු බදු ගණනය කරනු ලැබේ.

3.10.v. සහනදායී මෝටර් රථ බලපත්‍රයක් යටතේ ලබා ගනු ලබන මෝටර් රථයක පළමු ලියාපදිංචිය එම බලපත්‍රය හිමි නිලධාරියා (බලපත්‍ර ලාභියා) නමින් පමණක් සිදු කල යුතුය. එසේ ලියාපදිංචි කරනු ලබන වාහන වෙනත් පාර්ශ්වයකට පැවරීමේදී පහත නියමයන් අදාල වේ.

අ. මෙම චක්‍රලේඛයේ 3.10.iii වගන්තියෙහි දැක්වෙන 1 වන වාහන කාණ්ඩය යටතට ගැනෙන බලපත්‍ර ලාභියා නමින් පළමු ලියාපදිංචිය සිදු කර ඇති වාහන වල අයිතිය ඕනෑම අවස්ථාවකදී වෙනත් පාර්ශ්වයකට පැවරීමට බලපත්‍ර හිමියාට හැකියාව ලැබේ.

ආ. ඉහත 3.10.iii වගන්තියේ දැක්වෙන 2 වන වාහන කාණ්ඩය යටතට ගැනෙන, බලපත්‍ර ලාභියා නමින් පළමු ලියාපදිංචිය සිදු කර ඇති වාහන වල අයිතිය 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි 3.8 (i,) හා ( ii) සහ 3.10 (iv) වගන්තීන්හි දැක්වෙන අවශ්‍යතාවයන් හැර වෙනත් කිසිදු හේතුවක් මත ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට වසර පහක් (05) ගතවන තුරු වෙනත් පාර්ශ්වයකට පවරා දිය නොහැක.

ඇ. 2015.11.20 දින දක්වා ක්‍රියාත්මකව තිබූ 01/2013 චක්‍රලේඛ විධිවිධාන යටතේ ලබා ගෙන ඇති වාහන පැවරීම සම්බන්ධයෙන් 2014.03.25 දිනැති 01/(02)2013 චක්‍රලේඛයේ කොන්දේසි ඉදිරියටත් අදාල කරගතයුතුය.

ඇ. 2015.11.20 දින සිට 2017.06.09 දින දක්වා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ නිකුත් කර ඇති බලපත්‍ර මගින් ලබා ගෙන 2017.06.09 දින හෝ ඊට පෙර රේගුවෙන් නිදහස් කරගෙන ඇති වාහන 01/2016 චක්‍රලේඛයෙහි 3.8 (i,) හා ( ii) සහ 3.10 (iv) වගන්තීන්හි දැක්වෙන අවශ්‍යතාවයන් හැර වෙනත් කිසිදු හේතුවක් මත ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට වසර පහක් (05) ගතවන තුරු වෙනත් පාර්ශ්වයකට පවරා දිය නොහැක.

(මෙම චක්‍රලේඛ විධිවිධානය අනුව නිකුත් කලයුතු බලපත්‍රයේ ආකෘතිය ඇමුණුම 1 මගින් දැක්වේ)

ආර්.එච්.එස්. සමරතුංග
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

01. විගණකාධිපති
02. මහ බැංකුවේ අධිපති
03. අධක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති
04. අධක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති
05. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු
06. අධක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා
07. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර
08. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන
09. කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම්
10. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන

Annexure - 1

Permit No :

| T | 45 | VE | | 001 | | |
|---|---|---|---|---|---|---|

Name ..........................
NIC. No. ...........................
Designation ...........................
Institution .................................
Ministry .......................................

Dear Sir / Madam,

**IMPORTATION OF MOTOR VEHICLES IN TERMS OF TRADE AND INVESTMENT POLICY CIRCULAR NO. 01/2016**

This refers to your application dated ........................ on the above subject.

Approval is hereby granted to import one unit of motor vehicle in terms of Trade and Investment Policy Circular No. 01/2016 dated 14.07.2016, as amended, subject to the following conditions.

1. As specified in item No. 3.10(II) of the said circular, the maximum CIF value should not exceed US $ 30,000/- or its equivalent in any other currency as per the exchange rate that prevailed on the date of opening the Letter of Credit (LC).

2. The officer is liable to pay applicable Excise duty (subjected to the relevant effective rate) as follows.

| **Vehicle Category** | **CIF Value (US Dollars)** | **Payable Excise Duty** |
|---|---|---|
| 1 | 25,000 or less | 35 % of effective rate |
| 2 | More than 25,000 but not more than 30,000 | 40 % of effective rate |

3. A vehicle **which has the CIF value more than US $ 25,000** imported or purchased locally should not be transferred to any other party before the completion of five years from the date of first registration of the vehicle.

4. This permit is valid up to the importation of a vehicle or purchase of a locally assembled vehicle.

You are kindly requested to forward this letter along with other relevant documents to the "Director General of Customs" for the purpose of obtaining the duty waiver.

Yours faithfully

..................................................
Signature of the authorized officer
Name of the authorized officer .......................................
Designation .......................................

Cc:
1. Commissioner General of Motor Traffic, Department of Motor Traffic.
2. Auditor General, Auditor Generals Department
3. Director General, Department of Sri Lanka Customs
4. Director General, Department of Trade and Investment Policy
5. Manager ............................. Bank.
6. Personal File of ..............................................................